# කර්මාන්ත අමාත්‍යාංශය

# ලංකා පොස්පේට් ලිමිටඩ්

Lanka Phosphate Limited

# පුරප්පාඩු

## අයදුම්පත් කැඳවීම

කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ සම්පූර්ණයෙන් රජය සතු සමාගමක් වන ලංකා පොස්පේට් ලිමිටඩ් හි දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට හැකි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් හෙබි ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**"කළමනාකරණ සහකාර - තාක්ෂණික "සේවා ගණයේ (MA 2-1) - III ශ්‍රේණියේ සහකාර ප්‍රවාහන නිලධාරී තනතුර**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්** : තනතුරෙහි කාර්යභාරයට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, බර වාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තුව පිළිබඳව වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම හා පරිගණක හැකියාව හා ඊ සම්බන්ධ පාඨමාලාවක් හදාරා සහතිකපත් ලබා තිබීම.

NVQ Auto Mobile හෝ NVQ Management සහතික ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**අභ්‍යන්තර අයදුම්කරුවන්** : අදාළ ක්ෂේත්‍රයේ ප්‍රාථමික ශිල්පීය ගණයේ 1 වන ශ්‍රේණියේ වසර 05 ක පළපුරුද්ද සහ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ වසර 05 ක පළපුරුද්ද සහ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයකින් / තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

**මාසික වැටුප් පරිමාණය** : MA 2-1 2016 - රු. (30,310 - 10X300-07X350-04X495-20X660-50,940/-)

**වැටුප් පියවර** : රු. 30,310/-

**සේවා ස්ථානය** : ලංකා පොස්පේට් ලිමිටඩ් ලිමිටඩ් – එප්පාවල ව්‍යාපෘතිය

**වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා**

- රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව
- මාසික නිෂ්පාදන දිරි දීමනා
- පැමිණීමේ දීමනා
- ප්‍රවාහන දීමනා
- ආහාර දීමනා

**වෙනත් ප්‍රතිලාභ**

- වාර්ෂික ප්‍රසාද දීමනා
- ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
- සේ. අ. අ. සේ. භා. අ. දායකත්වය
- වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් බිල්පත් ප්‍රතිපූර්ණය
- පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය

**බඳවා ගැනීමේ ක්‍රමය :**

අයදුම්පත් කැඳවීමෙන් පසුව තනතුරට අදාළ වන පරිදි වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**බඳවා ගැනීමේ වයස :**

වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, අයදුම්පත් සම්පූර්ණ ජීවදත්ත ඇතුලත්ව උප්පැන්න සහතිකයේ පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෙනත් අදාළ වෘත්තියවේදී සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්ද සහිතව අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා දැනුම පිළිබඳ තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනය සමග නිසි පරිදි සම්පූර්ණ කර ලේඛනගත (ලියාපදිංචි) තැපැලෙන් හෝ විද්‍යුත් තැපැලෙන් 2020 දෙසැම්බර් මස 15 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබීමට සැලැස්විය යුතුය.

රජයේ සේවයේ/ රාජ්‍ය සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ දැනටමත් නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන පරිදි ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

කෙසේ වෙතත් යම් අයදුම්පත්‍රයක් හෝ සියලුම අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව තෝරා ගැනීම හා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලංකා පොස්පේට් ලිමිටඩ් ආයතනය සතු වේ.


**සභාපති, ලංකා පොස්පේට් ලිමිටඩ්,**

**අංක 73 1/1, නව කැලණි පාලම පාර, කොළඹ 14.**

**දුරකථන අංකය - 011-2459907/8**

**ඊමේල් - info@lpl.lk**